වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் வளங்கள் முகாமைத்துவ அமைச்சு
**Ministry of Irrigation & Water Resources Management**
වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
**Irrigation Management Division**

තැ.පෙ. 1702
වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල
බෞද්ධාලෝක මාවත, කොළඹ 07

த.பெ 1702
நீர்ப்பாசனத்திணைக்களகட்டிடம்
பௌத்தலோக்க மாவத்தை, கொழும்பு 07.

Po. Box 1702
Irrigation Department Building
Bauddhaloka Mawatha, Colombo 07.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My Ref No | 10/1/2/DO/ස්.මාරු/2018 | ඔබේ අංකය / உமது இல / Your Ref No. | | දිනය / திகதி / Date | 2018.02.26 |

සියලුම නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් වෙත,

**වාර්ෂික ස්ථාන මාරුවීම් සංවර්ධන නිලධාරි - 2018**

2018.03.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහි අමුණා ඇති ලේඛණයේ සඳහන් ස්ථාන මාරුවීම් මෙයින් නියෝග කරමි.

02. ඒ අනුව නිලධාරින් විධිමත් පරිදි මුදාහැරිමට කටයුතු කරන්න. නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කර ඒ බව ගණකාධිකාරිට පිටපත් සහිතව මා වෙත වාර්තා කිරිමට නිලධාරින්ට උපදෙස් ලබා දෙන්න.

03. ස්ථාන මාරුවීම් ලද නිලධාරින්ට ඒබව දැනුම් දිම සඳහා මේ සමඟ අමුණා ඇති ලිපි ප්‍රකාරව ලිපියක් නිකුත් කරන්න. අභියාචනා කමිටුවට අභියාචනයක් ඉදිරිපත් කළ නිලධරයන්ට පමණක් වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. එම අභියාචනය 2018.03. වෙනි දිනට පෙර මා වෙත ලැබෙන ලෙස ඉදිරිපත් කළ යුතු අතර, එදිනට පසුව ඉදිරිපත් කරන අභියාචනා ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. අභියාචනයේ සඳහන් කරුණු සනාථ කිරිමට අදාළ ලේඛන ද අමුණා එවිය යුතු වේ.

04. ඔබ ව්‍යාපාර කාර්යාලයේ සේවයේ නියුතු ස්ථාන මාරුවීම් ලබා ඇති නිලධරයන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේහි රාජකාරි භාර ගැනිමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයකු පැමිණෙන තෙක් රඳවා නොගෙන මුදා හැරිමට ක්‍රියා කරන ලෙස දන්වා සිටිමි. මගේ පූර්ව අනුමැතියකින් තොරව මොනම හේතුවක් නිසා හෝ ස්ථාන මාරුවීම් ලද නිලධාරින් 2018.03.02 දිනෙන් පසු ව්‍යාපාර කාර්යාලයේ රඳවා නොගත යුතු බව විශේෂයෙන් දන්වමි.

05. නිලධාරින් ඔබ කාර්යාලයේන් මුදා හැරීමට පෙර ඔවුන් භාරයේ තිබූ රජයේ බඩු බාහිරාදිය හා ලිපි ලේඛන විධිමත් පරිදි භාරගෙන ඒ බව මා වෙත දැන්විය යුතු වේ.

06. මෙම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ සඳහන් විධි විධාන වලට යටත්ව ගමන් වියදම් ගෙවිය යුතු ය. උපවේෂණ දීමනා ගෙවනු නොලැබේ.

චන්ද්‍රිකා වී. ඇතුගල
අධ්‍යක්ෂ
වාරිමාර්ග කළමනාකරණ අංශය.

පිටපත්:-

1. ලේකම්, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය- දැ.ගැ.ස.
2. ගණකාධිකාරි, වාරිමාර්ග කළමනාකරණ අංශය - දැ.ගැ.ස. සහ අ.ක.ස.
3. ලේකම්, සංවර්ධන නිලධාරි සංගමය - දැ.ගැ.ස.
4. සංවර්ධන නිලධාරි/ රාජ්‍ය කළමනාකරණ සහකාර (නිවාඩු/ ප්‍රතිපාදන /වැටුප් /ගබඩා/ ණය ) - දැ.ගැ.ස. සහ අ.ක.ස.
5. පෞද්ගලික ලිපි ගොනුවට

අධ්‍යක්ෂ
பணிப்பாளம்
Director (T.P/Fax) +94 11 2598085
කාර්යාලය
அலுவலகம்
Office +94 11 2504517
Fax : +94 11 2580683
Email : irrimandiv@gmail.com

.................................................... මයා/මිය/මෙනෙවිය,

සංවර්ධන නිලධාරී III

<u>සංවර්ධන නිලධාරී සේවයේ ස්ථාන මාරුවීම් 2018</u>

වාරිමාර්ග කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂගේ අංක 10/1/2/DO/ස්.මාරු/2018 හා 2017.02.2 දිනැති ස්ථාන මාරු නියෝගය අනුව 2018.03.02 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔබ ..................................................... ව්‍යාපාර කාර්යාලයට ස්ථාන මාරු කරමි.

02. .......................................නේවාසික ව්‍යාපාර කළමනාකරු වෙත රාජකාරි සඳහා වාර්තා කිරීමට 2018.03.01 දින සේවයනේ පසු මෙම කාර්යාලයේ සේවයෙන් ඔබ නිදහස් කරමි. නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට පෙර ඔබගේ රාජකාරී විෂයට අයත් සියලු ලිපි ලේඛණ, ඔබ සතුව ඇති රජයට අයත් සියලු බඩු බාහිරාදිය භාර දිය යුතු වේ.

03. නව ව්‍යාපාර කාර්යාලයේ රාජකාරී භාර ගැනීමෙන් පසු නේවාසික ව්‍යාපාර කළමනාකරු මඟින්, ඒ බව ගණකාධිකාරිට පිටපත් සහිතව වාරිමාර්ග කළමනාකරණ අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතු වේ.

....................................................

නේවාසික ව්‍යාපාර කළමනාකරු

......................... ව්‍යාපාර කාර්යාලය

වාරිමාර්ග කළමනාකරණ අධ්‍යක්ෂ වෙනුවට.

පිටපත් :-

1. අධ්‍යක්ෂ, වාරිමාර්ග කළමනාකරණ අංශය. - දැ.ගැ.ස. සහ අ.ක.ස.
2. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය........................./................ දැ.ගැ.ස.
3. ගණකාධිකාරී, වාරිමාර්ග කළමනාකරණ අංශය - දැ.ගැ.ස. සහ අ.ක.ස.
4. නේවාසික ව්‍යාපාර කළමනාකරු,............................නේවාසික ව්‍යාපාර කාර්යාලය - නිලධාරියා සේවයට වාර්තා කළ බව ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා කිරීම සඳහා
5. සංවර්ධන සහකාර/ රාජ්‍ය කළමනාකරණ සහකාර (වැටුප්/ප්‍රතිපාදන/ගබඩා/ප්‍රවාහන/ණය) - දැ.ගැ.ස. සහ අ.ක.ස.
6. පෞද්ගලික ලිපි ගොනුවට